# රන් කෙන්දෙන් බැඳ

රන් කෙන්දෙන් බැඳ
අතැඟිලි එක්කල ආදරයයි
පෙම් රැහැනින් බැඳ
සිතුම් වසඟ කල ආදරයයි

කිරිලිය සේ දුර පියා සලාලා
අත්තටු රිදුනා පමණයි
දැල විදාහල දැත මගේ
ඔබටත් ඔහුටත් උරුමයි
හිරු සඳු එකවර දෙපස නැගේ
කළුවර ඇයි විජිතයම මගේ

රන් කෙන්දෙන් බැඳ ...

කණාටු සුළඟේ දුහුළු මලකි අද
වල්මත් වී පා වෙන්නේ
ඔබගෙන්දෝ ඔහුගෙන්දෝ
මා හෙට දින සමු ගන්නේ

රන් කෙන්දෙන් බැඳ ...

*නන්දා මාලනී*